# පුරාවිද්‍යා පුවත්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පුවත් හසුන

13 වෙළුම
2 කලාපය
2017
මැයි-අගෝස්තු


## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 51 වැනි වාර්ෂික මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 51 වන වාර්ෂික මහා සභා රැස්වීම 2017 මාර්තු මස මස 19 වැනි දින පෙරවරුවේ කොළඹ රාජකීය ආසියාතික සමිතියේ ශාලාවේදී පවත්වන ලදි.

ගරු සභාපති මහින්ද මලලසේකර මහතා විසින් සභාව පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ විය. 2016 වර්ෂයේ පැවැති 50 වන වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව සමලේකම් බැනට් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලදි. එය සත්‍ය වාර්තාවක් බවට යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

2016/2017 වර්ෂය (51 වැනි වර්ෂය) සඳහා වූ සංගමයේ ප්‍රගති වාර්තාව ඉන් පසු සභාගත කරන ලදි. එහි 2016 අප්‍රේල් සිට 2017 මාර්තු දක්වා කාලය තුළ සංගමය මගින් සිදුකරන ලද කටයුතුවල ප්‍රගතිය, සාමාජිකයන් බඳවාගැනීම, වෙබ් අඩවිය, Google හා Facebook කණ්ඩායම් පිළිබඳ විස්තර, 50 වන සංවත්සර රැස්වීම හා විධායක සභිකයන්ගේ පැමිණීම යන තොරතුරු ඇතුළත් විය.

සංගමයේ 2016 වර්ෂය සඳහා වූ, ගණන් පරීක්ෂක විසින් අනුමත කරන ලද වාර්ෂික ගිණුම් වාර්තාව සභාගත කරන ලද්දේ ගරු භාණ්ඩාගාරික ලක්ෂ්මන් රත්නායක මහතා විසිනි. එයද යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

### ව්‍යවස්ථා සංශෝධන යෝජනාව

සංගමයේ විධායක සභාව විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා සංශෝධන යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලද අතර ඒවා සම්මත වූයේ ඊට එක් කරන ලද සංශෝධනද සහිතවය. සංගමයේ සාමාජිකයන් වෙත කලින් ලිඛිතව දැනුම්දී තිබූ මෙම සංශෝධනවල අරමුණ වූයේ මූලික වශයෙන් සංගමයේ සාමාජිකත්වය පිළිබඳ වූ නිර්ණායක සංශෝධනය කිරීමය. (අදාළ සංශෝධන 3 වන පිටුවේ සවිස්තරව දක්වේ.)

2 පිටුවට ⇨

## වාර්ෂික චාරිකාව 1 - කොළඹ නගරයේ කෞතුකාගාර

කොළඹ නගරයේ පිහිටා ඇති කෞතුකාගාර අතරින් පහත සඳහන් කෞතුකාගාර නැරඹීම සඳහා අධ්‍යයන චාරිකාවක් සංවිධානය කර තිබේ.

- තැපැල් කෞතුකාගාරය
- මහ බැංකුවේ ආර්ථික ඉතිහාස කෞතුකාගාරය
- ලංකා බැංකු කෞතුකාගාරය
- රේගු කෞතුකාගාරය

ඒ සඳහා සහභාගිවීමට කැමති සාමාජිකයන් 2017 මැයි 17 දින (බදාදා) පෙ. ව. 9.00ට තැපැල් කෞතුකාගාරය පිහිටා ඇති ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටා ඇති තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ලට පැමිණිය යුතු වේ. මෙම චාරිකාවට පැය හතරකට අධික කාලයක් ගත විය හැකි බැවින් ඔබට අවශ්‍ය ආහාරපාන සපයාගත යුතුය.

කරුණාකර ඔබේ පැමිණීම මැයි මස රැස්වීමේදී සමලේකම්වරුන් වෙත දැනුම්දෙන මෙන්ද ඉල්ලා සිටිමු.

## මාසික වැඩසටහන්

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ මාසික වැඩසටහන් මාලාව යටතේ මීළඟ මාස හතර ඇතුළත පැවැත්වීමට නියමිත වැඩසටහන් මෙසේය.

- **මැයි 14 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  නව කෞතුකාගාර පනත

  දේශකː රංජිත් හේවගේ මහතා
  (කෞතුකාගාර අධිකාරී, කොළඹ ජාතික කෞතුකාගාරය)

- **ජුනි 11 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  මාගම රාජ්‍යය හා රජවරුන්

  දේශකː පුරාවිද්‍යා චක්‍රවර්ති පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි

- **ජූලි 09 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  උඩරට රාජධානිය ආශ්‍රිතව ලියැවුණු සිංහල නවකතා පිළිබඳ ඓතිහාසික විවරණයක්

  දේශකː සේන තෝරදෙනිය මහතා
  (ප්‍රවීණ ලේඛක හා විචාරක)

- **අගෝස්තු 13 ඉරිදා ප.ව. 2.30ට**

  දේශන මාතෘකාව:
  ශ්‍රී ලංකාවේ තැපැල් සේවයේ ඉතිහාසය ගොඩනැගීමේලා වැදගත් වන මෙතෙක් අවධානය යොමු නොවූ මූලාශ්‍ර

  දේශකː මුදිත කරුණාමුනි මහතා
  (කොළඹ තැපැල් අභ්‍යාස විද්‍යාලය හා සමලේකම්, ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය)

ඉහත දේශන කොළඹ 7, ආනන්ද කුමාරස්වාමි මාවතේ, අංක 96 දරණ තැන පිහිටි රාජකීය ආසියාතික සමිතියේ රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. (මහවැලි කේන්ද්‍ර ගොඩනැගිල්ලේ පළමු මහළේ)

- දේශන පැවැත්වෙන දිනවල ප.ව. 1.00ට සංගමයේ විධායක සභා රැස්වීම පැවැත්වේ. ඒ සඳහා ගරු විධායක සභිකයින්ගේ පැමිණීම අපේක්ෂා කරමු.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ..... (1 පිටුවෙන්)

### සම්මාන සාමාජිකත්වය පිරිනැමීම

සංගමයේ ව්‍යවස්ථාවට අනුව සම්මාන සාමාජිකයන් ලෙස පත් කළ හැක්කේ 'සංගමයේ පරමාර්ථ සාදා ගැන්මෙහි ලා විශේෂ සේවයක් කළ තැනැත්තන්ය'. මේ අනුව පුරාවිද්‍යාව, ඉතිහාසය හා ඒ හා බැඳුණු සංස්කෘතිය හා සම්බන්ධව සේවය කළ තැනැත්තන් පස් දෙනෙකු සම්මාන සාමාජිකත්වය සඳහා වාර්ෂික මහා සභාවේ අනුමැතියෙන් පත් කළ හැකිය.

පහත නම් සඳහන් සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සිව්දෙනා වෙත සංගමයේ සම්මාන සාමාජිකත්වය පිරිනැමීම සඳහා විධායක සභාව විසින් සම්මත කර ඉදිරිපත් කරන ලද යෝජනාව **මහ**සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදි.

- මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ
- මහාචාර්ය විනී විතාරණ
- ආචාර්ය රෝලන්ඩ් සිල්වා
- මහාචාර්ය පී. ඇල්. ප්‍රේමතිලක


මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ


මහාචාර්ය විනී විතාරණ


ආචාර්ය රෝලන්ඩ් සිල්වා


මහාචාර්ය පී. ඇල්. ප්‍රේමතිලක

### නව නිලධාරි මණ්ඩලය පත්කිරීම

ඉන්පසුව එළැඹියේ නව නිලධාරි මණ්ඩලය සඳහා ඉදිරිපත්ව ඇති යෝජනාව සම්මත කිරීමයි. විධායක සභාව විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා සාමාජිකයන් වෙත දැනුම්දී තිබූ අතර, වෙනත් නාමයෝජනා නොතිබූ බැවින්, එම යෝජනාව සාමාජිකත්වය විසින් පිළිගන්නා ලදි.

ඒ අනුව 2017/2018 වර්ෂය සඳහා පත් වූ නව නිලධාරි මණ්ඩලය මෙසේය.

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | මහින්ද පී. මලලසේකර |
| ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති | : | රංජිත් හේවගේ |
| ගරු උපසභාපති | : | ආචාර්ය කාවන් රත්නතුංග |
| ගරු සමලේකම්වරු | : | මුදිත කරුණාමුනි |
| | | යොහාන් පෙරෙයිරා |
| ගරු සම්බන්ධීකරණ ලේකම් | : | සංජීවනී විද්‍යාරත්න |
| ගරු භාණ්ඩාගාරික | : | ලක්ෂ්මන් රත්නායක |
| ගරු සංස්කාරක | : | ධනේෂ් විසුම්පෙරුම |
| ගරු විධායක සභිකවරු (8) | : | බෙනට් ප්‍රනාන්දු |
| | | බන්දු වීරවර්ධන |
| | | හේමතිලක බණ්ඩාර |
| | | සී. එච්. ඉද්දගොඩ |
| | | සිරිල් ආරියපාල |
| | | ජිමී මාරඹේ |
| | | මහාචාර්ය රත්නසිරි අරංගල |
| | | අනුරාධ පියදාස |

ඉන්පසුව ගරු සභාපති මහින්ද පී. මලලසේකර මහතා සභාව ඇමතූ අතර, නව සමලේකම්වරයකු වන මුදිත කරුණාමුනි මහතා ස්තුති කතාව සිදුකළේය.

ඒ සමඟ ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ 51 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු සමාප්ත විය.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ නව ව්‍යවස්ථා සංශෝධනය

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ව්‍යවස්ථාව සඳහා පහත සඳහන් සංශෝධනය 2017.03.19 දින පැවැති වාර්ෂික මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදි. මේ අනුව සංගමයේ සාමාජිකත්වය සම්බන්ධ එම සංශෝධන එදින පටන් වලංගු වේ.

එබැවින් ඔබ විසින් සාමාජිකත්වය සඳහා අයදුම්කරුවන්ගේ නව අයැදුම්පත් යෝජනා කිරීමේදී හා ස්ථිර කිරීමේදී අදාළ අයැදුම්කරු අයැදුම් කරන සාමාජික කාණ්ඩය සඳහා සුදුසුකම් තිබේද යන්න ගැන සැලකිලිමත් වන ලෙස අපි ඉල්ලා සිටිමු.

ගරු සමලේකම්වරු

<u>පැවැති වගන්තිය</u>

**3. සාමාජිකත්වය:-** ඉහත සඳහන් පරමාර්ථ කෙරෙහි උනන්දුවක් දක්වන්නන් වශයෙන් විධායක සභාව විසින් පිළිගත හැකි අයට මේ සංගමයේ සාමාජිකයන් විය හැකි ය. සාමාජිකත්වය සම්මාන, යාවජීව, සාමාන්‍ය, ශිෂ්‍ය සහ ආයතන යනුවෙන් පස් වැදෑරුම් ය.

(අ.) සම්මාන සාමාජිකයෝ: සංගමයේ පරමාර්ථ සාදා ගැන්මෙහි ලා විශේෂ සේවයක් කළ තැනැත්තන් වන අතරින් විධායක සභාවේ කැමැත්ත පරිදි පස් දෙනෙක් නොහොත් එයට අඩු සංඛ්‍යාවක් වාර්ෂික මහා සභා අනුමැතියට යටත් ව තෝරා ගනු ලබති. මේ සාමාජිකයන්ට ඡන්ද බලය අහිමි ය.

(ආ.) යාවජීව සාමාජිකයෝ: මොවුන්ට ඡන්ද බලය හිමි ය.

(ඇ.) සාමාන්‍ය සාමාජිකයෝ: මොවුන්ට ඡන්ද බලය හිමි ය. සාමාජිකත්වය වර්ෂයකට සීමා වෙයි.

(ඈ.) ශිෂ්‍ය සාමාජිකයෝ: පාසල් අධ්‍යාපනය ලබන වයස අවුරුදු 19ට අඩු ශිෂ්‍ය-ශිෂ්‍යාවෝය. මේ සාමාජිකයන්ට ඡන්ද බලය අහිමි ය. ඔවුන්ගේ අයදුම්පත්‍ර අදාළ අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාගේ සහතිකයට යටත් ව විධායක සභා අනුමැතිය ලබන්නේ වෙයි. ඔවුන් පහත සඳහන් පරිදි ඇතුළුවීමේ ගාස්තුව පමණක් ගෙවිය යුතු ය. වයස අවුරුදු 19 සම්පූර්ණවීමෙන් පසු ව ඔවුන්ගේ සාමාජිකයන්ට අහෝසි වෙයි.

(ඉ.) ආයතන සාමාජිකයෝ: සංගමයේ පරමාර්ථ හා අනුකූල වන ක්‍රියාවලියක යෙදී සිටීම පදනම් සේ ගෙන විධායක සභාව මඟින් තෝරා ගැනෙන පූජ්‍යස්ථාන, දෙපාර්තමේන්තු, සංස්ථා, සමාගම්, සංගම් ආදි ආයතන වේ. ආයතනයකට එක් ඡන්දයක් හිමි ය.

<u>සංශෝධිත වගන්තිය</u>

**3. සාමාජිකත්වය:-** ඉහත සඳහන් පරමාර්ථ කෙරෙහි උනන්දුවක් දක්වන අයට සංගමයේ සාමාජිකත්වයට අයැදුම් කළ හැකිය. සාමාජිකත්වය සම්මාන, යාවජීව, සාමාන්‍ය, ශිෂ්‍ය සහ ආයතන යනුවෙන් පස් වැදෑරුම් ය. සම්මාන සාමාජිකත්වය හැර සෙසු සාමාජික කාණ්ඩ සඳහා වන අයැදුම්පත්‍ර සංගමයේ වලංගු සාමාජිකයකු හා විධායක සභිකයකු විසින් යෝජනා කර හා ස්ථිර කර තිබිය යුතුය. සම්මාන සාමාජිකත්වය හැර සෙසු සාමාජික කාණ්ඩවල අයැදුම්කරුවන්ට සාමාජිකත්වය පිරිනැමීම පිළිබඳ අවසන් තීරණය විධායක සභාව සතුය. කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම සාමාජික අයැදුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට විධායක සභාවට හැකිය.

(අ.) සම්මාන සාමාජිකයෝ: සංගමයේ පරමාර්ථ සාදා ගැන්මෙහි ලා විශේෂ සේවයක් කළ තැනැත්තන් අතරින් විධායක සභාවේ කැමැත්ත පරිදි පස් දෙනෙක් නොහොත් එයට අඩු සංඛ්‍යාවක් වාර්ෂික මහා සභා අනුමැතියට යටත් ව තෝරා ගනු ලබති. මේ සාමාජිකයන්ට ඡන්ද බලය හිමි ය.

(ආ.) යාවජීව සාමාජිකයෝ: පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ට යාවජීව සාමාජිකත්වයට අයැදුම් කළ හැකිය.

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් හෝ ඉහළ සුදුසුකම් තිබීම හෝ
2. පුරාවිද්‍යාව හා ඉතිහාසය සම්බන්ධ පර්යේෂණ කටයුතුවල යෙදී පිළිගත් ශාස්ත්‍රීය සඟරාවල පර්යේෂණ ලිපි හා පර්යේෂණ පත්‍රිකා පළ කර තිබීම හෝ
3. සාමාන්‍ය සාමාජිකයකු ලෙස වසර 5ක කාලයක් ක්‍රියාකාරීව කටයුතු කර ඇති බවට විධායක සභාව පිළිගත් නිර්ණායක සම්පූර්ණ කර තිබීම

මොවුන්ට ඡන්ද බලය හිමි ය.

(ඇ.) සාමාන්‍ය සාමාජිකයෝ: ශ්‍රී ලාංකික පුරවැසියන්ට මේ සඳහා අයැදුම් කළ හැකිය. මොවුන්ට ඡන්ද බලය හිමි ය. සාමාජිකත්වය මුදල් ගෙවූ වර්ෂයට සීමා වෙයි.

(ඈ.) ශිෂ්‍ය සාමාජිකයෝ: පාසල් අධ්‍යාපනය ලබන, වයස අවුරුදු 19ට අඩු ශිෂ්‍ය-ශිෂ්‍යාවෝය. මේ සාමාජිකයන්ට ඡන්ද බලය අහිමි ය. ඔවුන්ගේ අයදුම්පත්‍ර අදාළ අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාගේ සහතිකයට යටත් ව විධායක සභා අනුමැතිය ලබන්නේ වෙයි. ඔවුන් පහත ඇතුළුවීමේ ගාස්තුව පමණක් ගෙවිය යුතු ය. වයස අවුරුදු 19 සම්පූර්ණවීමෙන් පසු ව ඔවුන්ගේ ශිෂ්‍ය සාමාජිකත්වය අහෝසි වෙයි.

(ඉ.) ආයතන සාමාජිකයෝ: සංගමයේ පරමාර්ථ හා අනුකූල වන ක්‍රියාවලියක යෙදී සිටීම පදනම් සේ ගෙන විධායක සභාව මඟින් තෝරා ගැනෙන පූජ්‍යස්ථාන, දෙපාර්තමේන්තු, සංස්ථා, සමාගම්, සංගම් ආදි ආයතන වේ. ආයතනයකට එක් ඡන්දයක් හිමි ය.

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ ලිපිනය හා දුරකථන අංක

ලිපිනය - සම්බන්ධීකරණ ලේකම්
ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.

විද්‍යුත් තැපැල -
archaeology.org.lk@gmail.com

වෙබ් අඩවිය -
www.archaeology.org.lk

- ගරු සභාපති
  මහින්ද මලලසේකර 072-3322411
- ගරු ජ්‍යෙෂ්ඨ උප සභාපති
  රංජිත් හේවගේ 071-1712894
- ගරු උප සභාපති
  කාවන් රත්නතුංග 071-7072020
- ගරු සමලේකම්වරු
  මුදිත කරුණාමුනි 071-2287497
  යොහාන් පෙරෙයිරා 077-9651201
- ගරු සම්බන්ධීකරණ ලේකම්
  සංජීවනී විද්‍යාරත්න 071-5872591
- ගරු භාණ්ඩාගාරික
  ලක්ෂ්මන් රත්නායක 077-7985543
- ගරු සංස්කාරක
  ධනේෂ් විසුම්පෙරුම 071-4310794

## නිවේදන

- සාමාජික අයදුම්පත් සංගමයේ වෙබ් අඩවියෙන් PDF ලේඛනයක් ලෙස බාගත කළ (download) හැකිය.
- පුරාවිද්‍යා සංහිතා 4 හා 6 කලාප සංගමයේ රැස්වීම්වලදී හා සරසවි හා කියවන නුවණ (නුගේගොඩ) පොත්හල්වලින් ලබාගත හැකිය.
- අපගේ Google කණ්ඩායමේ ඊමේල් පණිවුඩ නොලැබේද? එසේ නම් ඔබේ නම, ලිපිනය හා සාමාජික අංකය සඳහන් කළ SMS පණිවුඩයක් සමලේකම් යොහාන් පෙරෙයිරා වෙත 077-9651201 අංකයට යොමු කරන්න.

## පුරාවිදු පුවත් සංස්කරණය

ධනේෂ් විසුම්පෙරුම
ගරු සංස්කාරක
dhaneshw@gmail.com

# සංගමයේ නිවේදන

## ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය පිළිබඳ කෘතිය වෙන්කර ගැනීම

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ පණස් වසරක ඉතිහාසය **නමින් සංගමය පිළිබඳ වැදගත් තොරතුරු රැසකින් යුක්ත පිටු 80කින් පමණ සමන්විත කෘතිය 2017 ජූලි මස පමණ වන විට එළිදැක්වීමට නියමිතය.**

**මෙම කෘතියේ සීමිත පිටපත් ප්‍රමාණයක් මුද්‍රණය කරන** බැවින් ඔබේ පිටපත කලින් මුදල් ගෙවා වෙන්කර ගැනීමට තවමත් ඔබට අවස්ථාව ඇත. අදාළ මුදල මැයි හා ජූනි මස රැස්වීමේදී හෝ ඊට පෙර ගරු භාණ්ඩාගාරික වෙත ලබාදී ලදුපතක් ලබාගන්නා මෙන් ඉල්ලා සිටිමු.

**සාමාජිකයන් සඳහා විශේෂ මිල** - රු. 200/= කි

ලියාපදිංචි තැපෑලෙන් ගෙන්වාගන්නේ නම් මිල - රු. 300කි.

## අළෙවිය සඳහා ඇති ප්‍රකාශන

පහත සඳහන් ප්‍රකාශන සංගමයේ රැස්වීම් දිනවලදී ලබා ගත හැකිය.

- **ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වෙළුම 4 - මිල රු. 170, (සාමාජිකයන් සඳහා විශේෂ මිල රු. 100කි.)**
- **ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංහිතා වෙළුම 6 - මිල රු. 250, (සාමාජිකයන් සඳහා විශේෂ මිල රු. 220කි.)**

## සංගමයේ ඉතිහාසය හා සම්බන්ධ ලේඛන

ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය සතුව ඇති සංගමයේ ඉතිහාසය හා සම්බන්ධ ලිපිලේඛනවල අඩුපාඩු පවතී. විශේෂයෙන් 1970 දශකය හා 1990 දශකය හා සම්බන්ධ ලිපිලේඛන එකතුවෙහි හිඩැස් පවතී. සාමාජික ඔබ සතුව පහත සඳහන් ලිපි ලේඛන තිබේද? එවැනි ලේඛනවල පිටපත් සංගමය වෙත ලබාදිය හැකි නම් අපි බෙහෙවින් කෘතඥ වෙමු. පහත සඳහන් ලේඛන විශේෂයෙන් වැදගත්ය.

- දේශන කැඳවීම් ලිපි
- දේශන සාරාංශ
- වාර්ෂික ප්‍රගති වාර්තා
- 'පුරාවිදු පුවත්' පුවත්හසුනේ පිටපත් (2005-2015 දක්වා)
- සංගමය මගින් ප්‍රකාශිත පොත්
- සංගමය හා සම්බන්ධ වෙනත් ලිපි ලේඛන

එවැනි ලිපි ලේඛන සංගමය වෙත ලබාදීම සඳහා සංස්කාරක ධනේෂ් විසුම්පෙරුම (071-4310794) අමතන්න.

**පුරාවිදු පුවත්** - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමයේ සාමාජිකත්වය
වෙනුවෙන් පළකෙරෙන පුවත් හසුනයි.

**ආපසු:**
සංජීවනී විද්‍යාරත්න
සම්බන්ධීකරණ ලේකම් - ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය
ජාතික කෞතුකාගාරය බාරේ
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07.